**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**
**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය ( විශේෂ උපාධි )**
**පළමු සෙමෙස්තරය - 2018/2019**

# SLG 4187 – සෞන්දර්ය විද්‍යාවේ මූලධර්ම හා සාහිත්‍ය විචාර දර්ශනය

(පැ දෙකයි)

කොටස් දෙකෙන්ම තෝරාගත් ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

## I කොටස

01. ප්ලේටෝගේ දාර්ශනික පද්ධතිය කෙරෙන් ඔහුගේ කලා විචාර න්‍යාය ප්‍රභවය ලබන අයුරු පහදා දෙන්න.

02. "**කාව්‍යශාස්ත්‍රයෙහි** වටිනාකමට තුඩුදෙන ප්‍රමුඛ හේතුවක් නම් ග්‍රීක ට්‍රැජඩි නාටකය පිළිබඳව එයින් සම්පාදනය කෙරෙන දැනීමයි." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. "කලාකරුවා නිර්මාණ කාර්යයට මෙහෙයවනුයේ වෛෂයික අවශ්‍යතාවයි." මාක්ස්වාදී කලා විචාර න්‍යාය ඇසුරින් විභාග කරන්න.

## II කොටස

04. "කාව්‍ය භාෂාව ශාස්ත්‍රීය සහ වාර්තාකථන භාෂාවකින් වෙනස් වූවකි යන්න පෙන්වා දීම අලංකාරවාදයේ මූලික සිද්ධාන්තයකි." සනිදර්ශනව පහදා දෙන්න.

05. "භාරතීය සෞන්දර්ය විද්‍යාව කාව්‍ය රසාස්වාදනය පිළිබඳ ප්‍රාමාණික ඉතිහාසයකින් සමන්විත වූවකි." විමර්ශනයක යෙදෙන්න.

06. "භාෂාවක වාච්‍යාර්ථය අභිභවා සම්භව වන්නකි ධ්වනිතාර්ථය." ධ්වනිවාදය ප්‍රමාණ කොට මේ පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

********************